# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*

ලංඩනයේ ගලක් මත බැඳි ගලක් තරමවත් දක්නට නොතිබුණු වකවානුවක ඉදිකැරුණ ලෝකයේ පැරණිතම එමෙන්ම විශිෂ්ටතම නගර වලින් එකක් ඉහත සඳහන් මටසිලුටු නාමයෙන් නියෝජනය වු බව දන්නෝ පෙරදිග ලෝකය ගැන දැන සිටි සුළු පිරිස අතර පවා ඉතා සංචාරකයින්ගේ සංඛ්‍යාව ඉතා අල්පය. ලංකාවේ සිටින මගේ මිතුරන් ගමනේ ඇති දුෂ්කර බව පිළිබඳව මට අනතුරු ඇඟවූහ. මගේ ගමනේ අත් දැකීම්ද ඊට කිසිසේත්ම නොඅඩු වූ බව අකමැත්තෙන් වුවද පිළිගැනීමට සිදුවිය. කඳුකරයෙන් පිටත්ව පළමු රාත්‍රිය

## තල්, පොල් සහ මුතු පබා - 11

## විස්මිත අනුරාධපුරය

විරලය. එහි අද දක්නට ලැබෙන අභාවයට ගිය ස්වරූපය යටතේ වුවද අනුරාධපුරය යනු සත්තකින්ම ලංකාවේ තල් ගස යයි හැඳින්විය හැකිය. නගරය එහි පැරණි ශ්‍රී විභූතියෙන් පැවති කල, එනම් මෙහි තිබුණු විසල් තඹ මාලිගයේ බිත්ති අතර සිට අනුක්‍රමිකව රජුන් 90 දෙනෙකු රජකම් කල අවධියේ, මෙම රාජකීය නගරය සැතපුම් 52ක වට ප්‍රමාණයකින් සමන්විත විය. වෙනත් ආකාරයකින් කියතොත්, උතුරු දොරකඩ සිට දකුණු දොරකඩ දක්වා දුර එක එල්ලේ සැතපුම් 16ක් විය.

අනුරෝ ග්‍රාමම් යනුවෙන් ටොලමි විසින් හඳුන්වන ලද අනුරාධපුරයට එම නම වැටුණේ ක්‍රි.පූ. 500දී සගයින් පස්දෙනෙකු කැටුව ඉන්දියාවේ සිට ලංකාවට පැමිණ මෙම නගරය පිහිටුවන ලද අනුරාධ නම් වු කුමාරයෙකුගේ නම ඇසුරෙනි. මෙහි ග්‍රාමම් යන්න ගම හෝ නගරය යන අරුතින් සංස්කෘතයේ භාවිතා වන ග්‍රාම යන්නෙන් බිඳී ආවකි. නගරයේ සෑහෙන කොටසක් ද්‍රවිඩයින් විසින් විනාශ කරනු ලැබීමෙන් අනතුරුව එහි පැරණි සෞභාග්‍යය වියැකී ගියෙන් දැනට සියවස් දොලහක කාල පරිච්ඡේදයක් පුරා එය ජන ශූන්‍යව පවතී. වැඩි දෙනෙකු නොදන්නා මෙම ලෝක පුදුම නගරය පිළිබඳව මට බොහෝ වතාවක් අසන්නට ලැබුණොත් මා එහි ළඟාවිය හැකි දුරකින් සිටින බව වැටහී ගිය මේ මොහොතේ කෙසේ හෝ එහි යාමට අදිටන් කර ගතිමි.

අනුරාධපුරය පිහිටා ඇත්තේ නුවර සිට සැතපුම් 90ක් පමණ උතුරු දෙසිනි. එහි යාමට ඇති අපහසුතාවය නිසාම අනුරාධපුරය නැරඹීමට යන මාතලේ ගත කොට පසුදා උදේ වඩාත් ග්‍රාමීය පරිසරයක් වු දඹුල්ල දක්වා ගියෙමු. ප්‍රසිද්ධ ලෙන් පන්සල් ඇත්තේ මේ අසලය. එතැනට ළඟා වීම සඳහා මගේ ගමන් මාර්ගයේ සිට බොහෝ ඈතට යාමට මට සිදුවිය.

එම ගල්ලෙන් ඉතා විශාල ඒවා වන අතර ඒවා විසිතුරු ලෙස අලංකාර කර ඇති ආකාරය ප්‍රශංසනීයය. ස්වභාවික ව සෑදුණු විශාල ගල්ලෙනක් තුල පන්සල් හතරක් සාදා තිබේ. එතුල තනා ඇති බුදු පිළිම සංඛ්‍යාව හතලිස් අටකි. එම බුදු පිළිම ඉදිකොට ඇත්තේ ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේ සිටි වලගම්බාහු රජුගේ කාලයේය. ප්‍රධාන පන්සල අඩි 178ක් දිග, අඩි 80ක් පළල සහ අඩි 25ක උසින් යුක්තය. බිත්තිවල සහ වහලයේ තවමත් ඉතා දීප්තිමත් ලෙස පෙනෙන පැහැදිලි වර්ණයන්ගෙන් බුදුන් වහන්සේ ගේ ජීවිතයේ අවස්ථා හතරක් පින්තාරු කර ඇත.

පසු දින සන්ධ්‍යා භාගය වන විට අපි කලා වැවට සමීප වුනෙමු. එම වැව ඉතා මෑතකදී ඉංග්‍රීසි ආණ්ඩුව මගින් පිළිසකර කර ඇති






ශ්‍රියා කුමාරසිංහ නවසීලන්තයේ සිට

පස්වන සියවසට අයත් විශ්මයජනක නිමැවුමකි. වර්ග සැතපුම් 7ක් පුරා පැතිරී ඇති වැව අඩි 20ක් ගැඹුරුය. මෙහි ඇති සමහර වැව් බටහිර ලෝකයේ දක්නට ලැබෙන දැවැන්ත නිර්මාණ අභිබවා යයි. නැතහොත් ඒවා හා සම තත්වයේ පවතී. ලංකාව පුරා ඇති වැව් අතර අඩුම තරමින් අති විශාල වැව් 30 ක් හා සුළු පරිමාණ වැව් 700ක් පමණ තිබේ. 12වන සියවසේ දී පරාක්‍රම බාහු විසින් 1470කට නොඅඩු වැව් සංඛ්‍යාවක් තනවන ලද අතර ඒවා පරාක්‍රම සමුදුරු ලෙස හඳුන්වයි. ආසන්නයේ ඇත්තේ රජෙකුගේ බලකොටුවක් වු විජිතපුරයයි. ක්‍රි.පු. 5 වන සියවස සමයේ අනුරාධපුරය කුඩා ගමක්ව තිබියදී විජිතපුරය නගර තත්වයෙන් පැවතිණි. විජිතපුරයෙන් පිටත් වු අපේ ගමන් මාර්ගය වැටී තිබුණේ නුවර කලාවිය මහ වනය හරහාය. දැනට ජන ශූන්‍යව ඇතත් කලකදී ප්‍රශංසනීය ලෙස වාරිමාර්ග සලසා තිබු බෙහෙවින් ජනාකීර්ණ ව පැවති ප්‍රදේශයකි. සැතපුම් ගණනාවක් යනතුරු අපට ගමන් කරන්නට සිදුවුණේ උල් සහිත ගස්මුල්, කටු පඳුරු වලින් ගහණ කැලෑ මැදින් හෝ හේන් යායවල් මැදිනි. පීරා යාමට නොහැකි තරමට ඝණ ව වැඩුණු මානා පඳුරු, එකට එතී දැලක් මෙන් ගෙතුණු කටු අකුල් හා කැකිල්ල පඳුරු, කටු වැල්, හා ගැණිය නොහැකි තරම් වු විදින පරපුටුවෝ අප තබන අඩියක් අඩියක් පාසා අපේ ඇඳුම් ඉරා දැමූහ. ශරීර සිදුරු කළහ. වරින් වර ඈතින් ඇසුණු ගෝනෙකුගේ හඬක්, ළඟපාත සිටින කොට්ටෝරුවෙකු ගසකට තට්ටු කරන රිද්මයානුකූල ශබ්දයක්, මොණරෙකුගේ කෑගැසිල්ලක්, පැන යන චිම්පන්සියෙකුගේ ගෝරනාඩුවක් මගින් වනයේ උණුසුම් නිහැඬියාව බිඳ හෙළුවේය. විටින් විට හිටි අඩියේ හිසට උඩින් විදුලි වේගයෙන් පනින රිලා රංචුවක් ශීඝ්‍රගාමී දුම්රියක වේගයෙන් නොපෙනී යයි.

ගමන් කරන අතර දක්නට ලැබෙන අනේක විධ වු පඹ ගාල්, ඔකිඩ් පැලෑටි, තද රතු හෝ රන්වන් පැහැයෙන් මුදුන් වැසී ගිය උසට වැඩුණු ලිලී යායවල්, දොඩම් පැහැති පෙඳ පාසි, දම් පැහැ ඉරී වැටුණු කහ වද මල්, රහස් කියන උණ පඳුරු, මන බඳින වෙනි වැල්, නැවක ඉස්තරම් නැංගුරම් කඹ වැනි පුස් වැල්, අපේ ඇස් පුදුමයට පත් කරවයි. අප සිටියේ සැබවින්ම අලි රජදහනකය. හාත්පසින්ම ඇත්තේ එම සතාගේ ප්‍රියතම ආහාරයක් වන කිතුල් වන ලැහැබකි. ඝණව වැඩුණු කොල අතු ගොන්නක් සහ අඩි 6 සිට 20 දක්වා පමණ උසට කෙලින් වැඩෙන කඳකින් යුතු කිතුල් ගසේ හට ගන්නා මල දිගට විහිදුණු තද නිල් හෝ තද රතු පැහැති මල් ඉති රාශියකින් යුක්තය. පොදිකන මීමැස්සන්, කුඩා මීයන්, හා වවුලන් ඒ වටා රොක් වෙති. ස්වදේශිකයින්ගේ මතයට අනුව කිතුල් ඇට ඇස් අන්ධ කරවීමට හා ඒවා ආහාරයට ගන්නා කුරුල්ලන් ගේ සිහිය විකල් කිරීමට සමත්ය.

රාත්‍රිය එළඹෙත්ම අපි අවුකන විහාර යනුවෙන් හඳුන්වන බුදුරුවක් අසල නතර වුනෙමු. අඩි 54ක් උසැති එම ප්‍රතිමාව මාර්ගයට තරමක් ඈතින් පිහිටි තද කළුගල් පර්වතයක බිත්තියෙහි නෙලා ඇත. ඒ අවට ඇති ගස් කහ සහ දම් පැහැති දිලීර වලින් වැසී අලංකාරව පෙණින.

(තවත් කොටසක් ලබන කලාපයේ)

කරු හීන්කෙන්ද ගේ

## පාරම්පරික ජ්‍යෝතිෂ රහස්




ඔස්ට්‍රේලියාවේ පදිංචි ප්‍රකට ජ්‍යෝතිර්වේදියෙකු වන කරු හීන්කෙන්ද මහතා විසින් රචිත ඉහත කෘතිය මගින් අප රටේ ජ්‍යෝතිෂය පිලිබඳව මෙතෙක් ලියැවී ඇති ග්‍රන්ථ මිගින් අනාවරණය නොවූ පැති කඩක් පාඨකයන් වෙත දායාද කරනු ලඅබ ඇත. ඉන්දියාවේ පැරණි ගුරු කුලයක ආශිර්වාසය ලබමින් වසර කීපයක් ජ්‍යෝතිෂ ශාස්ත්‍රය හදාරා ඇති කතුවරයා තමන් උගත් ශාස්ත්‍රයට අමතරව විවිධ උපනිෂධ් හා පුරාණයන් කියවීමෙන් ජ්‍යෝතිෂයේ ගැඹුරු තැන් අවනබෝධ කොටගත් ජ්‍යෙත්ර්වේදියෙකි.

හීන්කෙන්ද මහතා ඉහත පොතේ විස්ත්‍ර කරන අන්දමට ජ්‍යෝතිෂය යනු රාශි සටහන සහ විශෝත්තරී දශාවට පමණක් සීමා වූ විෂයයක් නොවේ. ජ්‍යෝතිෂය යනු වේදාංගයක් ලෙස ඔහු අර්ථ දක්වයි. වේදය යනු සත්‍ය දැනුම වන අතර වේදාංග ජ්‍යෝතිෂය යනු ලෝකෝත්තර හෙවත් අධ්‍යාත්මික වශයෙන් උසස් මට්ටමක සිට මෙම ලෝකය දැකීමයි. බොහෝ ජ්‍යෝතිර්වේදීනට මෙතෙක් පදනම හෙළි කරගෑනීමට නොහැකි වූ න්‍යායයන් සහ සිද්ධාන්ත රැසක් ඔහු මෙම පොත මගින් එළිදක්වා ඇත.
ජ්‍යෝතිශය යනු හුදෙක් පලාපල කථනයට සීමා වූවක් නොවන බවත් පලාපල කීම සඳහා වෙනත් ඕනෑම ක්‍රමයක් භාවිතා කළ හැකි වුවත් සංසාර සාගරයේ සැරි සරමින් සිටින සත්වයා එම සත්වයාගේ කර්ම බන්ධනය සංසාරික අරමුණු සහ එම අරමුණු වෙත ළඟා වන අකාකාරය පිලිබඳ අධ්‍යයනකයක යෙදීමට අවශ්‍ය නම් ඊස ඳහා මොලොව පවතින එකම විෂයය වන්නේ වේදීය ජ්‍යෝතිෂය පමණක් බවත් කතුවරයා විසින් පෙන්වා දෙනු ලැබ ඇත.

ග්‍රහ. රාශී භාව විශේෂ ලග්න මූලික උපාංග ආරූඪ කාල චක්‍රය ගෝචර චරකාරක හා කර්ම විපාක යන අංග පිළිබඳව විග්‍රහයක යෙදෙන කතුවරයා සමාජයේ විවිධ ස්ථර වල විසූ පුද්ගලයන් රැසක ජන්ම පත්‍ර උදාහරණයට ගනිමින් ඔවුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා සහ කඩඉම් ජ්‍යෝතිෂය ඇසුරු කරගෙන විග්‍රහ කරයි. මෙම පොත ජ්‍යෝතිෂය ඉගෙන ගන්නා අයට පමණක් නොව ජ්‍යෝතිර්වේදීනටද ප්‍රයෝජනවත් වන පරිදි මෙතෙක් හෙළි වී නොමැති සිද්ධාන්ත රැසක් විස්තර කරයි.
එමෙන්ම ජ්‍යෝතිර් ශාස්ත්‍රය පිලිබඳව උනන්දුවක් දක්වන අයට එහි මං පෙත් අනාවරණය කරගැනීම සඳහා මෙම පොත මහෝපකාරී වනු ඇති බව මගේ හැඟීමයි.

ශ්‍රියානි මද්දුමගේ